WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 S I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

**සංගීතය (පෙරදිග) I, II**
சங்கீதம் (கீழைத்தேய) I, II
Music (Oriental) I, II

## සංගීතය (පෙරදිග) II

※ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** අංක (i) සිට (iii) තෙක් සඳහන් ව ඇති තොරතුරු නිවැරදි නම් '√' ලකුණ ද, වැරදි නම් 'X' ලකුණ ද ප්‍රශ්න අංකය ලියා ඉදිරියේ සටහන් කරන්න.

(i) බිලාවල් රාගයේ වාදි-සංවාදි ස්වර වනුයේ පිළිවෙළින් ධෛවතය සහ ගාන්ධාරයයි.

(ii) උච්ච ෂඩ්ජය (ස්) ස්වරයට නියමිත කම්පන වාර සංඛ්‍යාතය 256කි.

(iii) 'සබේ විදානේ' චරිතය ඇතුළත් වනුයේ කෝලම් සම්ප්‍රදායේ ය.

- අංක (iv) සිට (vi) තෙක් හිස් තැන්වලට සුදුසු ම පිළිතුරු වරහන් තුළින් තෝරා ගෙන ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න. (ඩබ්ලිව්. බී. මකුලොළුව සූරීන්, ආචාර්ය ප්‍රේමසිරි ඛේමදාස සූරීන්, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර සූරීන්)

| නිර්මාණය | නිර්මාතෘ |
|---|---|
| මානස විල | (iv) .................................................. |
| සිංහබාහු | (v) .................................................. |
| දෙපානෝ | (vi) .................................................. |

- පහත හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු ඔබේ පිළිතුරු පත්‍රයෙහි පිළිවෙළින් ලියන්න.

(vii) තබ්ලාවේ නිර්මාතෘවරයා ලෙස හැඳින්වනුයේ .................................................. පඬිතුමා ය.

(viii) පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා ප්‍රවීණත්වය ඉසිලූ වාද්‍ය භාණ්ඩය .................................................. වේ.

(ix) "ශ්‍රී ලංකා මා ප්‍රියාදර ජය භූමී" (සැඩ සුළං) චිත්‍රපට ගීය .................................................. විසින් ගයනු ලැබූ අතර "රැජින මමයි අපේ රාජ්ජේ" (සංදේශය) චිත්‍රපට ගීය ගයනු ලැබුවේ .................................................. විසිනි.

(x) අල්හාජ් මොහිදීන් බෙග් සූරීන් ගැයූ "සුව දේ මට සීතල සුළඟ පවා" ගීය ඉන්දියානු .................................. ගායන ශෛලියට සම්බන්ධ වන අතර, එම්. එස්. ප්‍රනාන්දු සූරීන් ගැයූ "රස ආහර කවලා" ගීය .................................. සංගීතයට අනුගත ය.

WWW.OLEVELAPI.COM

**2.** පහත දැක්වෙන්නේ රාගධාරී තොරතුරු ඇතුළත් අසම්පූර්ණ වගුවකි.

| | රාගය | මේලය | ආරෝහණ | අවරෝහණ | වාදි-සංවාදි | රාග ජාතිය | ගාන සමය |
|---|---|---|---|---|---|---|---|
| A | (i) ......... | (ii) ........... | සරිගුමපධුනිස් | ස්නිධුපමගුරිස | (iii) ......... | සම්පූර්ණ | (iv) ........... |
| B | (v) ......... | කාෆි | (vi) ........... | ස්නිධපමගුරිස | (vii) ......... | ඖඩව සම්පූර්ණ | (viii) ........... |
| C | (ix) ......... | කල්‍යාණ | සරිගපධස් | (x) ........... | ග, ධ | (xi) ........... | (xii) ........... |

(i) ඉහත වගුව සම්පූර්ණ කිරීම සඳහා හිස්තැනෙහි ඇති රෝම ඉලක්කම ද අදාළ පිළිතුර ද ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(ii) A හෝ C රාග දෙකෙන් **එක්** රාගයකට අයත් මධ්‍යලය බ්‍යාල ගීයක හෝ ලක්ෂණ ගීයක හෝ සර්ගමයක හෝ වාදිතයක ස්ථායි කොටස තාල සංකේත සහිත ව ස්වර ප්‍රස්තාර කරන්න.

(iii) B තීරුවේ සඳහන් මේලයට ම අයත් නිර්දේශිත වෙනත් රාගයක් නම් කර, එහි ආරෝහණ, වාදි, සංවාදි ලියන්න.

[හයවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**3.** පහත දැක්වෙන තොරතුරු අනුව ගොඩනැගෙන නිර්දේශිත හින්දුස්ථානි තාල **හතර** හඳුනා ගන්න.

(a) බලි ස්ථානය පිහිටා ඇත්තේ තාලයේ සිව්වන මාත්‍රාවෙහි ය.

(b) බලි ස්ථානය පිහිටා ඇත්තේ තාලයේ පස්වන මාත්‍රාවෙහි ය.

(c) බලි ස්ථානය පිහිටා ඇත්තේ තාලයේ සයවන මාත්‍රාවෙහි ය.

(d) බලි ස්ථානය පිහිටා ඇත්තේ තාලයේ අටවන මාත්‍රාවෙහි ය.

(i) ඉහත තාල **හතරෙහි** නම් පිළිවෙළින් ලියන්න.

(ii) (c) හා (d) තාල දෙකෙන් **එක්** තාලයකට අයත් ඨේකාව, නියමිත තාල සංකේත සහිත ව ප්‍රස්තාර කරන්න.

(iii) මාත්‍රා 16කින් හා විභාග 4කින් යුත් නිර්දේශිත තාලයක් නම් කර, එය මත පදනම් වූ නිර්දේශිත මධ්‍යලය ඛ්‍යාල ගීයක හෝ ලක්ෂණ ගීයක හෝ සර්ගමයක හෝ වාදිතයක අන්තරා කොටස තාල සංකේත සහිත ව ස්වර ප්‍රස්තාර කරන්න.

(iv) ඉහත (iii) කොටසින් හැඟවෙන තාලය වැයීමේ දී තබ්ලාවෙහි දායාවෙන් (දහිනා) පමණක් වැයෙන අවනද්ධාක්ෂර නම් කරන්න.

**4.** පහත දැක්වෙනුයේ 'ගැමි ගී' සහ 'සෙ ගී' කිහිපයකට අයත් මුල් ගී පාදයන් ය.

- මන මත් කරවන දන මුළු දෙරණා
- ඉපිද එ බෝසත් නා ලොව වාරෙක
- තෙල් ගාලා හිස පීරන් නෑනෝ
- තුරු රත්න සිරි ලෙසිනා
- බුද්ධං සරණේ සිරස දරා ගෙන
- පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට
- අහසට පිඹිනා එරන් කළේ යා
- රන් දැකැති ගෙන නිති සැරසෙනවා

(i) ඉහත ගී පාද 'ගැමි ගී' හා 'සෙ ගී' යටතේ වර්ග කරන්න.

(ii) ගැමි ගී හා සෙ ගී පිළිබඳ විශේෂ ලක්ෂණ **හතර** බැගින් ලියා දක්වන්න.

(iii) "බුද්ධං සරණේ සිරස දරාගෙන" යන ගී පාදය ගැයෙන තිත් රූපය නම් කර, ඊට අයත් බෙර පදය ප්‍රස්තාර කරන්න.

(iv) එම ගී පාදය ඉහත තිත් රූපය අනුව තාලානුකූල ව පද ප්‍රස්තාර කරන්න.

**5.** (i) ආනන්ද සමරකෝන් සූරීන් සහ සුනිල් සාන්ත සූරීන් යන දෙදෙනාගෙන් **එක්** සංගීතඥයකුගේ සංගීත මෙහෙවර කරුණු **හතරක්** යටතේ උදාහරණ සහිත ව විස්තර කරන්න.

(ii) ග්‍රැමෆෝන් තැටි ගී යුගය පිළිබඳ ඔබ දන්නා තොරතුරු **හතරක්** ලියන්න.

(iii) ග්‍රැමෆෝන් ගී සඳහා ගායනයෙන් දායක වූ **තිදෙනෙකුගේ** නම් ද, ඔබ දන්නා ඕනෑම ග්‍රැමෆෝන් ගීත **තුනක** මුල් ගී පාදය බැගින් ද ලියා දක්වන්න.

**6.** ශ්‍රී ලංකාවේ ප්‍රචලිත රංග ශෛලීන් දෙකකට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

- දකුණු ඉන්දියානු සංගීතාභාසය ලැබී ඇත.
- ශාලාවක් තුළ වේදිකාගත වේ.
- "වාසනා දිනේකි මේක" මෙම ශෛලියට අයත් ප්‍රචලිත ගීයකි.
- මද්දල දෙකකින් අඩු තාල් වැඩි තාල් වාදනය කෙරේ.
- මෙම රංග ශෛලියේ ගීත සඳහා තබ්ලාව වාදනය කෙරේ.
- තිර්ලානා පසන් චඩ්මුඩ් වැනි තාල භාවිත කෙරේ.
- "ගම්භීර තෙදැති කොන්ස්තන්තීනු පුරේ" මෙම රංග ශෛලියේ ප්‍රචලිත ගීයකි.
- නීතිඥ ජෝන් ද සිල්වා සූරීන්ගේ නාමය මෙම රංග ශෛලිය හා බද්ධ ව පවතී.

(i) උක්ත රංග ශෛලීන් **දෙක** නම්කර ඒ ඒ ශෛලිය යටතේ අදාළ ඉහත තොරතුරු වෙන වෙන ම වගුගත කරන්න.

(ii) මෙම එක් එක් රංග ශෛලියට අදාළ නිෂ්පාදනයක් ගීතයක් හා සංගීතඥයෙක් බැගින් නම් කරන්න.

(iii) මෙම රංග ශෛලීන් දෙක පිළිබඳ ව ඒවායේ නාට්‍යමය හා සංගීතමය ලක්ෂණ පිළිබිඹු කෙරෙන කරුණු **පහක්** සංසන්දනාත්මකව ලියා දක්වන්න.

**7.**



(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය, පෙරදිග සංගීත ක්‍රමයට අනුව තාලානුකූල ව ස්වර ප්‍රස්තාර කරන්න.

(ii) එම පෙරදිග ස්වර ප්‍රස්තාරය මධ්‍යම භාවයට පෙරළා නැවත ප්‍රස්තාර කරන්න.

(iii) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරයෙහි නොමැති Flat, Sharp, Tie, Rest mark, Bass clef, Semibreve යන අපරදිග ස්වර සංකේත දළ රූප සටහන් මගින් පෙන්වන්න.

(iv) 'අපරදිග සංගීත සංධ්වනි' යන්න පිළිබඳ කරුණු **පහක්** යටතෙහි විස්තරයක් කරන්න.

***

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....